සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# මූලික පිරිවෙන් ප්‍රථම වාර පරීක්ෂණය - 2019
Primary Piriven First Term Test - 2019

## ත්‍රිපිටක ධර්මය II

5 - ශ්‍රේණිය

කාලය : පැය 3 යි
Time :

**සැලකිය යුතුයි -**
**I කොටසේ ප්‍රශ්න සියල්ලටමද II කොටසින් තෝරාගත් ප්‍රශ්න හතරකටද පිළිතුරු සපයන්න.**

**I - පත්‍රය**

(01) පහත දැක්වෙන ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

1. සතර පාරාජිකා නම් කරන්න.
2. වධකෙ දෙවදත්තමහි යන ගාථාව සම්පූර්ණ කර අර්ථය ලියා දක්වන්න.
3. සැරියුත් තෙරුණ් වහන්සේට බුදුරදුන් විසින් පිරිනැමූ තනතුරු තුනක් නම් කරන්න.
4. විනය පිටකයේ උභතො විභංගයට ග්‍රන්ථ දෙක නම් කරන්න.
5. සිගාලක සූත්‍රයේ ඉගැන්වෙන සතර අගති නම් කරන්න.
6. සතර මහා භූත රූප ලියා දක්වන්න.
7. " මානය නම් මැනීමයි" එය මැන බලන ප්‍රභේද තුනක් ඇත ඒවා අර්ථ සහිතව ලියා දක්වන්න.
8. සූත්‍ර පිටකයට අයත් ඛුද්දක නියනයේ ග්‍රන්ථ පහලොවකි. ඉන් දෙවැන්න නම් කරන්න.
9. නිෂ්පන්න රූප අතරට ගනු ලබන පසාද රූප පහ නම් කරන්න.
10. මාරයාට පවා තර්ජනය කරමින් එඩිතර ශ්‍රාවකයන් වහන්සේ නමක් ලෙස ක්‍රියා කළ තෙරුණ් හැඳින් වූයේ කිනම් නමකින්ද?

(ලකුණු 2 x 10 = 20)

## II කොටස

02. i බුදුන් වහන්සේ තුළ පවත්නා උත්තරීතර මානුසීය ගුණාංග හතරක් නම් කරන්න. (ලකුණු 2)
ii බුදුන් වහන්සේගේ නිහතමානීත්වය ප්‍රකට කෙරෙන අවස්ථා දෙකක් විස්තර කරන්න. (ලකුණු 3)
iii තාදි ගුණයෙන් බුදුන් වහන්සේ ශ්‍රේෂ්ඨත්වයට පත්වන අයුරු සනිදර්ශනව පහදන්න. (ලකුණු 5)

03. i සප්ත ආපත්තිස්කන්ධ අතුරෙන් තුනක් නම් කරන්න. (ලකුණු 2)
ii අදින්නාදාන පාරාජිකා පන්තිය අර්ථ සහිතව ලියා දක්වන්න. (ලකුණු 3)
iii දෙවන පරාජිකා පන්තියට බලපෑ නිදාන කතාව විස්තර කරන්න. (ලකුණු 5)

04. i අපාය මුඛ හතරක් ලියා දක්වන්න. (ලකුණු 2)
ii කල්‍යාණ මිත්‍ර සේවනය තුළ ඇසුරට ගත යුතු මිතුරන් සිව්දෙනා නම් කර ඉන් එක් අයෙකුගේ ස්වරූපය ලියන්න. (ලකුණු 3)
iii යුතුකම් ඉටුකිරීම තුළින් දෙමව්පිය - දූදරු සබඳතාවය අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් වන අයුරින් සිගාලක සූත්‍රය ඇසුරෙන් විමසන්න. (ලකුණු 5)

05. සහ සසම පිවෙ ගාථා .................................
යො සහ සසං සහ සෙසන .......................... යන ගාථා දෙක සම්පූණ කරන්න. (ලකුණු 2)

i උක්ත ගාථා දෙකින් කියවෙන පද අරුත් ලියා දක්වන්න. (ලකුණු 3)
ii යහපත් ජීවිතයක් ගත කිරීමේදී අර්ථ සහිත පදවල පවත්නා වැදගත් බව විස්තර කරන්න. (ලකුණු 5)

06. සතර පරමාර්ථ නම් කරන්න. (ලකුණු 2)
භාවරූප දෙක ලියා දක්වන්න. (ලකුණු 3)
රූප සමුට්ඨාන තුළින් රූප උපදවන හේතු පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 5)